www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: කම්කරුවන් 200,000 වැඩ වර්ජනය කරද්දී වෘත්තීය සමිති වැටුප් ඉල්ලීමෙන් පසු බැසීමට සැරසෙයි

**Sri Lanka: As 200,000 workers stop work, unions prepare to retreat on pay demand**

ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි
2006 අප්‍රේල් 7

කාර්මික ක්‍රියාව සීමා කිරීමට ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති නායකයන් දරූ තැත නොතකා සියයට 65 වැටුප් වැඩි කිරීමේ ඉල්ලීමට සහයෝගය දීම සඳහා රාජ්‍ය අංශයේ 200,000 කම්කරුවෝ සඳුදා (3) ලෙඩ නිවාඩු දමා වැඩට යාමෙන් වැලකී සිටියහ. රාජ්‍ය අංශයේ වැටුප් සමාලෝචන වෘත්තීය සමිති කමිටුවට (රාඅවැසවෘසක) විසින් සඳුදා "සත්‍යග්‍රහය" හෙවත් වඳ විරෝධතාව සංවිධානය කලේ 300,000 කම්කරුවන් මාර්තු 16 වර්ජනයට සහභාගි වීමෙන් පසුව ය.

මාර්තු 16 වර්ජනයට මුලුමනින් ම වාගේ සහභාගි වූ දුම්රිය සේවය තුල සහභාගිත්වයේ අඩුව පැහැදිලිව දකින්නට තිබුනි. සඳුදා විරෝධතා ව්‍යාපාරයට සම්බන්ධ වූයේ ධාවනාගාර, කර්මාන්ත ශාලා, අංගනාගාර සහ කාර්යාල කාර්ය මංඩලය පමනි.

දුම්රිය රියැදුරන්ට, ස්ථානාධිපතිවරුන්ට, ගාඩ්වරුන්ට සහ සංඥා පාලකවරුන්ට වැඩ වර්ජනයට සම්බන්ධ නොවන ලෙස ඔවුන්ගේ වෘත්තීය සමිති විසින් උපදෙස් දී තිබුනි. උතුරු-නැගෙනහිර යුද කලාපවල තැපැල් සහ රෝහල් සේවකයන් අරගලයට සම්බන්ධ වූ නමුත් දෙමල ගුරුසංගමය "මානසික ධෛර්යය" පමනක් ප්‍රකාශ කරන ලදී. කොලඹ විහාර මහා දේවී උද්‍යානයේ පැවැති රැලියට සහභාගි වූයේ 1,000 අඩු සංඛ්‍යාවකි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පාලක එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවට එරෙහි දේශපාලන අරගලයක් නියතව ම ඉල්ලා සිටින නමුත් උද්ඝෝෂනයේ සීමා සහිත ස්වභාවය එවන් අරගලයකට රාඅවැසවෘසක නුසූදානම් බවට කම්කරුවන්ට කෙරෙන අනතුරු ඇඟවීමකි. මාර්තු 16 වර්ජනයට සහභාගි වූ සමහර වෘත්තීය සමිති ආන්ඩුවට ඔවුන්ගේ ඇති පක්ෂපාතිත්වය එලිපිටම ප්‍රකාශ කරමින් සඳුදා විරෝධතා උද්ඝෝෂනයට සහභාගි නොවූහ. දූන් රාඅවැසවෘසක නායකයෝ උද්ඝෝෂනය නතර කිරීමේ මගක් සොයමින් සිටිති.

උද්ඝෝෂනයට සම්බන්ධ නොවීමට ඔවුන්ගේ වෘත්තීය සමිති ගෙන තිබූ තීන්දුව කඩකරමින් වර්ජනයට සම්බන්ධ වූ කම්කරුවන් ද ඇතුලුව මාර්තු 16 වර්ජනයට සම්බන්ධ වූ බොහෝ කම්කරුවෝ වඳ "සත්‍යග්‍රහ" නිෂ්ඵල, කාලය කා දමන උද්ඝෝෂන ලෙස අවඥාවට ලක් කරති. වෘත්තීය සමිති නායකයෙකු විසින් විහාරමහාදේවී උද්‍යානයේ දී ඉදිරිපත් කල ශෝක ජනක කන්නලව්ව වෘත්තීය සමිතිවල අලස ආකල්පය කැටි කර පෙන්වයි: "2006 ජනවාරි 12 වැටුප් සමාලෝචන චක්‍රලේඛ 1-2 අහෝසි කර නව වැටුප් ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීමට ජනාධිපතිතුමාට සහ ආන්ඩුවට ඥානය පහල වේවා" යි ඔහු ප්‍රකාශ කලේ ය. රාජ්‍ය අංශයේ කම්කරුවන්ට එරෙහිව දුෂ්ට මාධ්‍ය උද්ඝෝෂනයක් සහ හොරිකඩයන් ලෙස සහ කම්කරුවන් ත්‍රස්ත කිරීමත් ඔවුන්ට හිරිහැර කිරීමත් යන දෙආකාරයෙන් ම සන්නද්ධ හමුදාවන් යෙදවීම මගින් ආන්ඩුව එහි "ඥානය" ප්‍රදර්ශනය කර තිබේ.

රාජ්‍ය වියදම් කැපීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවෙන් යෙදෙන පීඩනය යටතේ කම්කරුවන්ට සැලකියයුතු සහන සැලසීමේ අදහසක් ජනාධිපති මෙන් ම මුදල් ඇමතිවරයා ද වන රාජපක්ෂට නැත. නමුත් රාජ්‍ය අංශයේ කම්කරුවන්ගේ උද්ඝෝෂනය මිල ඉහල යාම නිසා බරපතල ලෙස පීඩාවට පත්ව සිටින කම්කරුවන්ගේ පලල් ස්ථර සහ ගැමි දුගීන් රැලිකර ගන්නා ව්‍යාපාරයක් බවට පරිවර්තනය වනු ඇතැයි ඔහු කලබලයට පත්ව සිටී.

ආන්ඩුව සඳුදා ප්‍රධාන රෝහල්වලට සහ දුම්රිය ස්ථානවලට හමුදාව යෙදවී ය. කොලඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂට අනුව "රෝහලේ කටයුතුවලට උදව් කිරීම" සඳහා නාවික භටයන් 200ක් යොදවා තිබුනි. විරෝධතා රැලිය පැවති කාලය තුල විහාරමහාදේවී උද්‍යානය අසල කැරලි මර්දන භට කංඩායම් ඇතුලුව සිය ගනනක් පොලිස් නිලධාරීහු යොදවා සිටියහ.

එදින ම පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට (ශ්‍රීලනිප) අනුබද්ධ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ වාර්ෂික රැස්වීම "වගකීමෙන් ක්‍රියා කරන ලෙස"ට වෘත්තීය සමිති නායකයන්ට අනතුරු ඇඟවීමට ජනාධිපති රාජපක්ෂ ප්‍රයෝජනයට ගත්තේ ය. "හුදෙක් ඔවුන්ගේ අයිතීන් ගැන උද්ඝෝෂනය කිරීම පමනක් නොව කම්කරුවන් සෙසු පුරවැසියන් ගැනත් සිතිය යුතු යි. ඔවුන්ගේ අයිතීන් ඉල්ලීම සඳහා වෘත්තීය සමිති ක්‍රියාවලට යාමට පෙර රට සහ එහි ආර්ථික වර්ධනය ගැන ද කම්කරුවන් කල්පනා කල යුතු ය"යි ඔහු තව දුරටත් පැවසී ය.

රාජ්‍ය අංශයේ කම්කරුවන් ට ඔවුන්ගේ වැටුප් ඉල්ලීම නොලැබෙන බව නිශ්චිත භාෂාවෙන් ජනාධිපති ප්‍රකාශ කලේ ය. පුද්ගලික අංශයේ කම්කරුවෙකුට රුපියල් 3,800ක මාසික අවම වැටුප හා සංසන්දනය කරන විට රාජ්‍ය අංශයේ කම්කරුවෙකු දැනට මත් රුපියල් 11,600ක මාසික අවම වැටුපක් ලබන බව ඔහු සාවද්‍ය ලෙස පැවසී ය. වර්තමාන අවම වැටුප වන රුපියල් 9,600න් විවිධ නය සඳහා රුපියල් කිහිප දහසත් අඩු කල විට අතට ලැබෙන මුදල ඉහල යන ජීවන වියදමට කිසි සේත් නො සෑහෙයි.

විහාරමහාදේවී උද්‍යානයේ රැස්ව සිටි කම්කරුවන් ඇමතූ රාඅවැසවෘසක කැඳවුම්කරු, සමන් රත්නප්‍රිය " වර්තමාන තත්වය නිර්මානය කිරීම" ගැන කලින් තිබූන වැටුප් කොමිසමේ ප්‍රධානියා වූ තිස්ස දේවේන්ද්‍රට දෝෂාරෝපනය කිරීම මගින් ආන්ඩුවේ වගකීම යට ගැසී ය. "ආන්ඩුව හමුදාව යොදවා ඇතත් ඔවුන්ට කම්කරුවන් කරන වැඩ කල නොහැකි" බව වාචාල ලෙස ප්‍රකාශ කරමින් කම්කරුවන්ට එරෙහිව හමුදාව යෙදවීමේ අන්තරාය ඔහු ඉවත දැමී ය. සාකච්ඡා සඳහා රාජපක්ෂට කල ආයාචනයකින් ඔහුගේ කථාව අවසන් කලේ ය. එය රාඅවැසවෘසක අරගලය පාවාදීම සූදානම් කෙරෙන බවට තවත් ඉඟියකි. ඔවුන් අවම "අතුරු දීමනාවක්" පිලිගැනීමට සූදානම් බව වෘත්තීය සමිති දැනට මත් ඇඟවුම් කර තිබේ.

සමාජවාදී ප්‍රතිපත්ති මත පදනම් වෙමින් රාජපක්ෂ ආවන්ඩුවට එරෙහිව දේශපාලන ප්‍රහාරයක් සඳහා පැහැදිලි කැඳවුමක් සහිත එහි ප්‍රකාශනය බෙදා හැරීමෙන් සමාජවාදී සමානතා පක්ෂය (සසප) වැලැක්වීමට වෘත්තීය සමිති නායකයෝ උත්සාහ කලහ. සසප සාමාජිකයන්ට එරෙහිව කායික බලය යොදන ඔවුන් විහාරමහාදේවී උද්‍යානයෙන් එලියට ඇද දමන බවට රත්නප්‍රියගේ සහචරයන් කන්ඩායමක් තර්ජනය කලහ. රාඅවැසවෘසක සියලු ම පත්‍රිකා බෙදීම තහනම් කර ඇති බවත් "කම්කරුවන්ට දේශපාලනය අනවශ්‍ය" බවත් එහි ප්‍රකාශක නිවේදනය කලේ ය. මෙම ප්‍රජාතන්ත්‍රවිරෝධී විධික්‍රමය ගැන අභියෝග කල විට " එහෙම ප්‍රජාතන්ත්‍රවාදයක් කොහෙවත් නැතැයි" රත්නප්‍රිය උද්දච්ඡ ලෙස ප්‍රකාශ කලේ ය.

එසේ වුවත් එහි ප්‍රකාශනයේ -- රාජ්‍ය අංශයේ කම්කරුවන් සඳහා ඉදිරිමාවත -- පිටපත් දහස් ගනනක් කම්කරුවන් අතර බෙදා හැරීමට සසපය සමත් විය. පහත වැටෙන ජීවන තත්වයන්, වෘත්තීය සමිති උද්ඝෝෂනයේ දිශානතිය ගැන අතිශයින් ම කනස්සල්ල පල කල කම්කරුවෝ දේශපාලනය කතාකිරීමට වැඩි උනන්දුවක් දැක්වූහ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කොලඹ කාර්යාලයේ රියැදුරන් කන්ඩායමක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසී ය. "සංවිධානය කිරීම හරිම දුර්වලයි. අරගලය හරියට සංවිධානය කරන්න අපේ නායකයන්ට උවමනාවක් නැහැ. දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වැඩ කරන නිසා කිසිම බාධාවකින් තොරව දුම්රිය ධාවනය කරනවා. උද්ඝෝෂනයට සහයෝගය ගොනු කිරීම සඳහා කම්කරුවන් දැනුවත් කිරීමේ රැස්වීම් වැඩපලවල්වල තිබුනේ නැහැ."

"වර්තමාන වැටුපෙන් ජීවත්වෙන්න බැරි නිසයි අප මෙම අරගලයට සහභාගිවුනේ. දැනට මට ලැබෙන සම්පූර්න වැටුප රුපියල් 13,000ක් වන නමුත් නයවාරික සහ අනෙකුත් අඩුකිරීම් කලාට පසුව අතට ලැබෙන්නේ රුපියල් 9,700ක් පමන මුදලක්. වෘත්තීය සමිති නායකයන් අපට මේ ආන්ඩුවට ඡන්දය දෙන්න කිව්ව නිසා අප එහෙම කලා. මේ විධිහට අපේ අරගලය දිනන්න බැරි බව මට තේරෙනවා. වැඩ කරන ජනතාවගේ පොදු අරගලයක් අප සංවිධානය කල යුතුයි." නුගේගොඩ තැපැල් සේවකයකු පැවසී ය.

සසප ප්‍රකාශනය කියවීමෙන් පසුව මොරටුව තැපැල් සේවකයකු මෙසේ පැවසී ය. "වැටුප් ප්‍රශ්නය ආන්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය සමග සම්බන්ධවෙලා තිබෙන ආකාරයත් ජාත්‍යන්තර කම්කරු පන්තිය ඔවුන්ගේ රටවල්වල දී එක හා සමාන ප්‍රහාරවලට මුහුන දී සිටන බවත් මට තේරුම් ගන්න පුලුවනි. අපේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අප ගෙන යන අරගලයේ දී ජාත්‍යන්තර කම්කරු පන්තිය සමග මේ රටේ කම්කරු පන්තිය එකමුතුව ගොඩ නගා ගැනීම අවශ්‍යයි".

රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ නායක මුරුත්තෙට්ටුවේ ආනන්ද රාජ්‍ය සේවකයන්ගේ උද්ඝෝෂනයට විරුද්ධ වීම හෙද සේවිකාවක් හෙලා දුටුවා ය. "වැටුප් ප්‍රශ්නයට මොන ම විසඳුමක් වත් දීම ආන්ඩුව මගහරිනවා. නමුත් කම්කරු පන්තියේ පුලුල් කොටස් සංවිධානය කිරීමට වෘත්තීය සමිති නායකයන් සමත්වෙලා නැහැ. ආන්ඩුව වඩවඩා සහන දෙන්නේ ධනපතියන්ට සහ ව්‍යාපාරිකයන්ට."

යුද්ධයේ අත්දැකීම් ගැන කතා කරමින් ඇය තවදුරටත් මෙසේ පැවසී ය. "යුද්ධය ගැන අපට කටුක අත්දැකීම් තියෙනවා. ඒ දවස්වල හැම තැනක ම බෝම්බ පිපුරුවා. දෙපැත්තෙම දහස් ගනනක් මිනිස්සු මැරුනා. යුද්ධයේ දී වටිනා තරුන ජීවිත අපට අහිමි වුනා. ඒ නිසා

මිනිස්සු යුද්ධයට විරුද්ධ විය යුතුයි. යුද්ධය සඳහා වියදම් කරන මුදල් මහජන සුබසාධනය සඳහා යොදන්න කියලා අප ඉල්ලා සිටිය යුතුයි."

1980 මහ වර්ජනය සමිති නායකයන් විසින් පාවා දීමෙන් පසුව දොට්ට වැටුන 150,000න් ඇය එක් අයෙකු බව රත්නපුර කෘෂිකර්ම කාර්යාලයේ සේවිකාවක් පවැසී ය. එකල විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (සසප පෙරගමන්කරු) *කම්කරු මාවත* පත්‍රය කියවීමට හුරුව සිටි බව ඇය මතක් කලා ය. "මට රක්ෂාව ආපසු ලැබුනේ 1996දී. සමිති නායකයන් ගැන මට විශ්වාසයක් නැහැ. ආන්ඩුවට බලපෑම් දැමීම හැර ඔවුන්ට පැහැදිලි ක්‍රියා මාර්ගයක් නැහැ.

"කම්කරු පන්තියට දේශපාලන ක්‍රියා මාර්ගයක් අවශ්‍ය යි. කම්කරු පන්තියේ අනෙකුත් කොටස් සහ දුප්පත් ජනයා එක ම ව්‍යාපාරයක් තුලට සංවිධානය කල යුතු යි. එමෙන්ම ඔබ සඳහන් කලා වගේ අයිතීන් ආරක්ෂා කර ගැනීමේ අරගලයේදී කම්කරු පන්තියට ජාත්‍යන්තර එකමුතුව අවශ්‍ය යි. නමුත් එවැනි අරගලයකට සමිති නායකයන් විරුද්ධයි. ඔවුන් හැම කෙනෙක්ම කිව්වා රාජපක්ෂට ඡන්දෙ දෙන්න කියලා. ඒක දේශපාලනය නෙමෙයි ද? ඒක ඔවුන්ගේ දේශපාලනය. කම්කරු පන්තියට ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් අවශ්‍යයි."

© www.wsws.org